**ශීර්ෂය 13 - ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2017 වර්ෂය**

---

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය යටතේ වන විසර්ජන ගිණුම ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් විගණනය වෙත ඉදිරිපත් කරන ලදී. එම ගිණුමෙන් නිරූපනය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

## 1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම

---

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන විෂය පථය

---

ශීර්ෂය 13 - ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනීම, නීති,රීති හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2018 ජුනි 23 දින කොමිෂන් සභාවේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.4 විගණන නිරීක්ෂණය**

**----------------------**

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ කරන ලද විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.12 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 127 හි සඳහන් විධිවිධාන ඉටුකිරීමේදී අනාවරණය වූ පහත සඳහන් සටහනේ සාරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටු කර තිබුණු බව නිරීක්ෂණය විය.

| **මුදල් රෙගුලාසි 127 ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය** | | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරී එම විධිවිධානයට අනුගත වී නොතිබීම** | **නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව** |
|---|---|---|---|
| **මුදල් රෙගුලාසි** | | | |
| 127 (1)(අ) | නිවැරදිව සහ මූල්‍ය විධිමත් බවෙන් යුක්තව කටයුතු කරන බව තහවුරුවන පරිදි සියළු මූල්‍ය කාර්යයන් සැලැසුම් කළ යුතු වීමත්. | ක්‍රියාකාරී සැලැස්මේ අඩුපාඩු | 2.2.1 |
| 127(1)(ආ) | වියදම් සහ රාජ්‍ය ආදායම් එකතු කිරීම පිළිබඳව ප්‍රමාණවත් තරම් පාලනයකට විධිවිධාන සැලැසෙන ක්‍රමයක් සම්පාදනය කළ යුතුවීම. | 1. අවිධිමත් ගනුදෙනු | 2.4 |
| | | 2. කළමනාකරණ දූර්වලතා | 2.5 |
| | | 3. බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු | 2.7 |
| | | 4. නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම | 2.9 |
| | | 5. අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත නොකිරීම | 2.10 |
| | | 6. විගණන හා කළමනාකරණ කමිටුව ස්ථාපිත නොකිරීම | 2.11 |

| | | | |
|---|---|---|---|
| | | 7. අතිරික්ත කාර්ය මණ්ඩලය සඳහා අනුමැතියක් ලබා නොගැනීම | 2.12(ආ) |
| 127(2) | තමාගේ පාලනය යටතේ පවත්නා දෙපාර්තමේන්තුවල එවකට තිබෙන වැය විෂයයන් මෙන්ම අළුතින් හෝ වැඩියෙන් වියදම් කිරිම සඳහා වන යෝජනා සැකසුරුවම්කම හා කාර්යක්ෂමතාවය අතින් අමාත්‍යාංශයේදී තියුණු පරීක්ෂාවකට භාජනය කිරීම. | 1. කාර්යභාරයන් ඉටු නොකිරිම<br>2. බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු<br>3. කාර්ය මණ්ඩලය විධිමත් පරිදි පුහුණු නොකිරීම | 2.2.2<br>2.7<br>2.12.(අ) |
| 127(3) | ස්වකීය පරිපාලනාත්මක කෘතහස්තතාව හා විචාර බුද්ධිය මෙහෙයවා සුදුසු පරිදි ක්‍රියා කළ හැකි වන පිණිස සැකයක් හෝ උද්ගත වී ඇති සියළු ප්‍රශ්ණ තමා වෙත ඉදිරිපත් වෙන ආකාරයක් සලසා තිබීම. | 1. කාර්යසාධන වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත නොකිරිම<br>2. ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම<br>3. බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම් | 2.2.3<br>2.3(අ) හා 2.8<br>2.3(ඉ) |
| 127(4) | තමාගේ එක් එක් ගණන්දීමේ නිලධාරියා විසින් විසර්ජන ගිණුම විධි වූ පරිදි ඉදිරිපත් කරන බවට හා තමා ඒවා අත්සන් කිරීමට පෙර අමාත්‍යාංශයේදී පරීක්ෂා කරනු ලබන බවටත්, එසේම ඇස්තමේන්තුවල ප්‍රතිපාදිත මුදල සහ තථ්‍ය වියදම අතර පවත්නා සැලැකිය යුතු වෙනස්කම් තමා විසින්ම, දැඩි ලෙස විමර්ශනයට භාජනය කිරීම | අධි ප්‍රතිපාදන සලසා ගැනීම | 2.6 |

## 2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

-----------------------------------------------

### 2.1 කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යභාරයන්

------------------------------------------

(අ) සියළුම රාජ්‍ය ක්‍රියා පටිපාටීන් ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සහතික කර ඇති මූලික අයිතිවාසිකම්වලට අනුකූල වන බවට තහවුරු කිරීම.

(ආ) මූලික අයිතිවාසිකම්වලට අනුකූලව නීති සම්පාදනය, පරිපාලන විධි නියමයන් සහ ක්‍රියා පටිපාටීන් සකස් කිරීම සඳහා රජයට උපකාරී වීම සහ උපදෙස් දීම.

(ඇ ) මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමක් හෝ උල්ලංඝනය කිරීමට ආසන්නව තිබීම පිළිබඳව පැමිණිලි විභාග කිරීම, විමර්ශනය කිරීම සමථය හා සමගි කිරීමෙන් ඒවා විභාග කිරීමට පියවර ගැනීම.

(ඈ) ශ්‍රී ලංකාව එළඹ ඇති ජාත්‍යන්තර මානව හිමිකම් ගිවිසුම් බැඳීම්වලට අනුකූලව ජාතික නීති සහ පරිපාලන පරිචයන් සකස් කළ හැකි ආකාරය පිළිබඳව රජයට නිර්දේශ ලබා දීම.

(ඉ) අන්තර් ජාතික මානව හිමිකම් ගිවිසුම් සහ මානව හිමිකම් ක්ෂේත්‍රයන් ඇති වෙනත් අන්තර්ජාතික මෙවලම් පිළිගැනීම සම්බන්ධයෙන් රජයට උපදෙස් ලබා දීම.

(ඊ) රට තුළ මානව හිමිකම් පිළිබඳ දැනුම ප්‍රවර්ධනය කිරීම.

### 2.2 කාර්යසාධනය

----------------

#### 2.2.1 සැලැසුම් කිරීම

----------------

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2017 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේදී කොමිෂන් සභාව විසින් ඉටු කළ යුතු ප්‍රධාන කාර්යභාරයන් 06 ක් පැවැති අතර, කොමිෂන් සභාව අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීම සඳහා පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්ම සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයට යාවත්කාලීන කළ ආයතනයේ සංවිධාන ව්‍යුහය, අනුමත කාර්ය මණ්ඩලය සහ දැනට සේවයේ යෙදී සිටින කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාළ වාර්ෂික අයවැය පදනම් කර ගත් ප්‍රමුඛතා අනුව සකස් කළ ක්‍රියාකාරකම් සැලැසුම (Activity Plan), ක්‍රියාත්මක කළ කාල රාමුව (Time Line) හා එම ක්‍රියාකාරකම්වල අපේක්ෂිත නිමවුම්/ ප්‍රතිඵල (Output/ Outcome) යනාදිය පිළිබඳ විස්තර ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) වාර්ෂික ක්‍රියාකාරකම් සඳහා වන අක්මුදල් අවශ්‍යතා සැලැස්ම (Imprest Requirement Plan) පිළියෙල කර නොතිබුණි .

**2.2.2 කාර්යභාරයන් ඉටු නොකිරීම**

**--------------------------------**

2017 වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්ම අනුව කොමිෂන් සභාව විසින් ප්‍රධාන කාර්යභාරයන් 6 ක් ඉටු කළ යුතුව තිබුණි. ඒ අනුව පැමිණිලි ප්‍රගතිය පිළිබඳ විස්තර පමණක් ඉදිරිපත් කර තිබුණු අතර අනෙකුත් කාර්යභාරයන් ඉටුකිරීමේ ප්‍රගතිය පිළිබඳව තොරතුරු විගණනය වෙත ඉදිරිපත් කිරීමට කොමිෂන් සභාවේ කාර්යාලය අපොහොසත් විය. කෙසේ වුවද, ප්‍රධාන කාර්යභාරයන් ඉටුකිරීම සඳහා වාර්ෂික අයවැය ඇස්තමේන්තුව මගින් එකතුව රු.මිලියන 208 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර ඉන් රු. මිලියන 9 ක ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි. 2017 වර්ෂය ආරම්භයේ නොවිසඳී ඉතිරිව තිබූ පැමිණිලි 3,046 ක් හා 2017 වර්ෂයේදී පැමිණිලි 7,949 ක් ලැබී තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේදී කොමිෂන් සභාව විසින් පැමිණිලි 10,995 ක කටයුතු කිරීමට සිදු වී තිබුණි. නොයෙකුත් හේතු මත පැමිණිලි 2,917 ක් ඉවත් කර තිබුණු අතර ඉතිරි පැමිණිලි 8078 කින් සමථයකට පත්කළ පැමිණිලි සංඛ්‍යාව 195 ක්ද, අධිකරණය හා වෙනත් බලධාරීන් වෙත යොමු කළ පැමිණිලි 25 ක්ද , නිරීක්ෂණ (නිර්දේශ) ලබා දෙන ලද පැමිණිලි 84 ක්ද ඇතුළුව පැමිණිලි 304 ක කටයුතු නිම කර තිබුණි.

**2.2.3 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

**-------------------------------**

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව කොමිෂන් සභාව විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත සමාලෝචිත වර්ෂයට අදාළ කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, එම වාර්තාව 2018 ජුනි 07 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

**2.3 වත්කම් කළමනාකරණය**

**--------------------------**

කොමිෂන් සභාවේ වත්කම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

**(අ) වත්කම් ලේඛනගත කිරීම**

**----------------------------**

ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා නොතිබුණි.

**(ආ) වාහන උපයෝජනය**

**---------------------**

කොමිෂන් සභාවේ විමර්ශන කටයුතු ඉටු කරන ලබන නිලධාරීන් වෙත යතුරුපැදි 24 ක් භාර දී තිබුණි. නමුත් එම යතුරුපැදි රාජකාරි කටයුතු සඳහා යොදාගන්නා බව තහවුරු කෙරෙන සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. එම යතුරු පැදි වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයන්ටද භාජනය වී නොතිබුණි.

(ඇ) **නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

---------------------------------------

කොමිෂන් සභාව සතු අපහරණය කළ යුතු බව නිර්දේශ කර තිබුණු රු.120,000ක් පමණ වටිනා යතුරුපැදි 04 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අපහරණය නොකර රථගාලේ ගාල්කර තිබුණි.

(ඈ) **වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

--------------------------------------

2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදු කර එම වාර්තා චක්‍රලේඛයේ 3.2.6 ඡේදය ප්‍රකාරව 2018 ජුනි 15 දින වන විට විගණනය වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණි. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදු කර තිබුණත්, චක්‍රලේඛයේ 3.2.4 හා 3.2.5 යන ඡේද ප්‍රකාරව සමීක්ෂණ මණ්ඩලයේ වාර්තාවේ සඳහන් නිර්දේශ කර තිබුණු භාණ්ඩ විකිණීම, අපහරණය කිරීම හා අළුත්වැඩියා කිරීම් 2018 අප්‍රේල් 10 දින වන විටත් නිම කර නොතිබුණි. එම කටයුතු ඉටු නොකර පිළියෙල කළ සමීක්ෂණ මණ්ඩල වාර්තාව 2018 ජූලි 17 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

(ඉ) **බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්**

-------------------------------------------

2017 නොවැම්බර් 07 දින ජනාධිපති ලේකම් කාර්යාලය වෙත කොමිෂන් සභාව සතු ජීප් රථ දෙකක් හා වෑන් රථයක් භාරදී තිබුණත්, එම වාහන නීත්‍යානුකූලව පවරා දී නොතිබුණි.

**2.4 අවිධිමත් ගනුදෙනු**

-------------------

කොමිෂන් සභා කාර්යාලයේ ගනුදෙනු සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් අවිධිමත් ගනුදෙනු අනාවරණය විය.

(අ) පවිත්‍රතා සේවාව ලබාගැනීම සඳහා ඉදිරිපත් කර තිබුණු ලංසු අතරින් තෝරා ගන්නා ලද කොන්ත්‍රාත්කරු විසින් ලංසු ඉදිරිපත් කිරීමේ අයදුම්පතක්, (Bid Submition Form) ඉදිරිපත් කර නොතිබුණි. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.8.4(ඊ) මාර්ගෝපදේශය ප්‍රකාරව එම අවශ්‍යතාවය ඉටු නොකිරීම විශාල බැහැරකිරීමක් ලෙස සලකා ප්‍රසම්පාදන කමිටුව විසින් කටයුතු කළ යුතුව තිබුණත්, එසේ සිදු කර නොතිබුණි.

(ආ) 2016 අගෝස්තු 08 දින ගෙවීමක් ලෙස ගිණුම්ගත කර ලියා තිබුණු රු.67,717 ක් වටිනා චෙක්පතක් 2018 ජනවාරි 31 දින වන විට මාස 16 ක කාලයක් ඉක්මවා තිබුණත්, එම චෙක්පත අදාළ පාර්ශවය වෙත නිකුත් කර නොතිබුණි.

(ඇ) 2017 දෙසැම්බර් 14 දින වර්ක්ස්ටේෂන් එකක් මිලදී ගැනීම සඳහා රාජ්‍ය සංස්ථාවක් වෙත ඇණවුමක් නිකුත් කර තිබුණි. අදාළ භාණ්ඩය කොමිෂන් සභා කාර්යාල වෙත ලැබුණු බව තහවුරු කර ගැනීමකින් තොරව අදාළ සංස්ථාව විසින් නිකුත් කළ ඉන්වොයිසියක ඡායාපිටපතක් පදනම් කරගෙන රු.154,721 ක චෙක්පතක් ලියා නිකුත් නොකර කාර්යාලයේ රඳවා ගෙන තිබුණි..

(ඇ) කොමිෂන් සභාවේ කාර්යාලයේ සේවයේ යෙදී සිටියදී අනතුරකට පත් වූ නිලධාරිණියකට 1993 සැප්තැම්බර් 21 දිනැති අංක 22/93 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු නොකර, සමාලෝචිත වර්ෂයේදී රු.225,063 ක ප්‍රවාහන දීමනා ගෙවා තිබුණි.

## 2.5 කළමනාකරණ දූර්වලතා

**සෘජුව ලබාගත් විදේශාධාර**

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ස්විස්ටර්ලන්ත රජය හා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන මගින් 2016 වර්ෂයේදී කොමිෂන් සභාව වෙත රු.මිලියන 6.46 ක විදේශාධාර ලබා දී තිබුණි. එම විදේශාධාරවලින් 2017 ජනවාරි 01 දින වන විට රු.මිලියන 4.22 ක් උපයෝජනය නොකර ඉතිරිව පැවතුණි. ඉන් සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 3.55 ක් උපයෝජනය කර තිබුණි. 2014 ජුනි 26 දිනැති අංක එම්ඕඑෆ්පී/ඊආර්ඩී/2014/01 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයේ විධිවිධාන අනුව එම විදේශාධාර පිළිබඳ විස්තර විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත දන්වා අවශ්‍ය කටයුතු කළ යුතුව තිබුණත්, කොමිෂන් සභාවේ කාර්යාලය විසින් එසේ කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 1.15 ක විදේශාධාර කොමිෂන් සභාව වෙත ලැබී තිබුණි. එම විදේශාධාර සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 620,625(3) හා 625(7) ප්‍රකාර කටයුතු කළ යුතුව තිබුණි. නමුත් කොමිෂන් සභා කාර්යාලය විසින් එසේ කටයුතු කර නොතිබුණු අතර, එම විදේශාධාර පිළිබඳ තොරතුරු රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙතද දන්වා නොතිබුණි.

## 2.6 කාර්යභාරයන් ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරීම

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 05 ක කාලය තුළ කොමිෂන් සභාවට සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| වර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන | උපයෝජනය රු.මිලියන | ඉතිරිය රු.මිලියන | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| 2013 | පුනරාවර්තන | 149.95 | 144.84 | 5.11 | 3.41 |
| | මූලධන | 12.75 | 5.59 | 7.16 | 56.16 |
| | **එකතුව** | **162.70** | **150.43** | **12.27** | **7.54** |
| 2014 | පුනරාවර්තන | 150.50 | 137.87 | 12.63 | 8.39 |
| | මූලධන | 40.75 | 15.73 | 25.02 | 61.40 |
| | **එකතුව** | **191.25** | **153.60** | **37.65** | **19.69** |
| 2015 | පුනරාවර්තන | 172.20 | 159.91 | 12.29 | 7.14 |
| | මූලධන | 14.30 | 8.73 | 5.57 | 38.95 |
| | **එකතුව** | **186.50** | **168.64** | **17.86** | **9.58** |

| | | | | | |
|---|---|---|---|---|---|
| 2016 | පුනරාවර්තන | 174.00 | 170.30 | 3.70 | 2.13 |
| | මූලධන | 14.20 | 13.19 | 1.01 | 7.11 |
| | **එකතුව** | **188.20** | **183.49** | **4.71** | **2.50** |
| 2017 | පුනරාවර්තන | 197.25 | 192.34 | 4.91 | 2.49 |
| | මූලධන | 11.45 | 7.26 | 4.19 | 36.59 |
| | **එකතුව** | **208.70** | **199.60** | **9.10** | **4.36** |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**අධිප්‍රතිපාදන සලසා තිබීම**

---------------------------

වැය විෂයයන් 03 ක් සඳහා එකතුව රු.මිලියන 5.6 ක අධිප්‍රතිපාදන සලසා තිබීම නිසා එම වැය විෂයයන්වලින් උපයෝජනය කළ පසු ඉතිරිය රු.මිලියන 2.5 ක් වී තිබුණි. ඒ අනුව වැය විෂයයන් සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 12 ක සිට සියයට 63 ක් දක්වා පරාසයක ප්‍රමාණවලින් ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි.

**2.7 බැංකු ගිණුම් මෙහෙයවීම**

---------------------------

2007 සැප්තැම්බර් 05 දිනැති අංක 5/2017 දරන භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛය ප්‍රකාරව නව බැංකු ගිණුම් ක්‍රියාත්මක කිරීමත් සමගම ඊට සමගාමීව පවතින පැරණි බැංකු ගිණුම් සියල්ලම වසා දැමීමට කටයුතු කළ යුතුව තිබුණි. නමුත් කොමිෂන් සභාවේ නිල බැංකු ගිණුමට අමතරව තවත් බැංකු ගිණුම් 05 ක රු.මිලියන 1.5 ක ශේෂ සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් පැවතුණි.

**2.8 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

------------------------------------------

කොමිෂන් සභාව විසින් මුදල් රෙගුලාසි 751 හා 763 රෙගුලාසි ප්‍රකාරව විධිමත් පරිදි තොග පොත් පවත්වා නොතිබුණි.

**2.9 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

---------------------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| **නීති, රීති හා රෙගුලාසිවලට යොමුව** | **වටිනාකම** | **අනුකූල නොවීම** |
|---|---|---|
| | රු. | |
| **(අ) ව්‍යවස්ථාපිත විධිවිධාන** | | |
| 1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 30 වන වගන්තිය | | 2015, 2016 හා 2017 වර්ෂවලට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| **(ආ)** | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ කාර්ය පටිපාටික රීති සංග්‍රහය**<br>**----------------------------------------** | |
| | vii වැනි පරිච්ඡේදයේ 89 වගන්තිය | සභාවේ නිලධාරීන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව භාරදීමට ක්‍රියාකර නොතිබුණි. |
| **(ඇ)** | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය**<br>**-------------------------------------** | |
| | මුදල් රෙගුලාසි 135 | මුදල් රෙගුලාසි විධිවිධානවලට අනුකූලව අභ්‍යන්තර පරීක්ෂාවක් සිදුවන ආකාරයට කොමිෂන් සභාවේ කාර්යාලයේ නිලධාරීන් අතර මුල්‍ය බලතල පැවරිය යුතුව තිබුණත්, එම අවශ්‍යතාවය ඉටුවන පරිදි කාර්යාලයේ නිලධාරීන් අතර මුල්‍ය බලතල පැවැරීමක් සිදු කර නොතිබුණි. |
| (ඈ) | **2016 මැයි 31 දිනැති අංක 36/2016 දරන අභ්‍යන්තර චක්‍රලේඛය** | කොමිෂන් සභාව විසින් අදාළ නිලධාරීන්ගේ රාජකාරි කටයුතුවලට ඍජුව අදාළත්වයක් නොමැති අධ්‍යයන වැඩසටහන් හදාරණ නිළධාරීන් දෙදෙනෙකුටද රු. 136,162ක අධ්‍යයන සහය ලබා දී තිබුණි. චක්‍රලේඛය ප්‍රකාරව මුල්‍ය සහය ලබාගන්නා නිලධාරීන් විසින් ත්‍රෛමාසික ප්‍රගති වාර්තා ඉදිරිපත් කළ යුතු වුවද, අදාළ නිලධාරීන් විසින් එම වාර්තාද ඉදිරිපත් කර නොතිබුණි. |

**2.10** **අභ්‍යන්තර විගණනය**

**------------------------**

කොමිෂන් සභාවේ කාර්යාල සඳහා අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි.

**2.11** **විගණන හා කළමනාකරණ කමිටුව**

**-------------------------------------**

කොමිෂන් සභාව විසින් විගණන හා කළමනාකරණ කමිටුව ස්ථාපිත කර නොතිබුණි.

**2.12** **මානව සම්පත් කළමනාකරණය**

**අනුමත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම**

ඉහත 2.1 ඡේදයේ සඳහන් කාර්යභාරය ඉටු කිරීම සඳහා 2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය, පුරප්පාඩු හා අතිරික්ත කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් කොමිෂන් සභාව විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය යටතේ රු. මිලියන 96.7ක් වැය කර තිබුණි. ඒ අනුව ඒක පුද්ගල වියදම රු. 636,161 ක් වී තිබුණි.

| | සේවක වර්ගය | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 46 | 14 | 32 | - |
| (ii) | තෘතියික මට්ටම | 58 | 01 | 57 | - |
| (iii) | ද්විතියික මට්ටම | 88 | 92 | - | 04 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 41 | 46 | - | 05 |
| (v) | අනියම්/කොන්ත්‍රාත්/ | - | 01 | - | 01 |
| | | 233 | 154 | 89 | 10 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) **කාර්ය මණ්ඩලය පුහුණු කිරීම**

කොමිෂන් සභාවේ කාර්යාලයේ නිලධාරීන්ට පරිගණක පුහුණු පාඨමාලාවකට සහභාගීවීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.225,055 ක් වැය කර තිබුණත්, එම පාඨමාලාව සඳහා නිලධාරීන් විධිමත් පරිදි සහභාගී වූ බව තහවුරු කිරීමට ප්‍රමාණවත් තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**(ආ)** **අතිරික්ත කාර්ය මණ්ඩලය අනුමත කර නොගැනීම**

සමාලෝචිත වර්ෂය අවසාන වන විට 10 දෙනෙකුගෙන් සමන්විත අතිරික්ත කාර්ය මණ්ඩලය වෙනුවෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතියක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.